# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2461/41 – 2025 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා – 2025.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතිය**

84 වන වගන්තිය යටතේ දැන්වීම

**2024 අගෝස්තු 21 දිනැති අංක 2398/19 දරන ගැසට් පත්‍රයට අදාළ සංශෝධනය**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන යෝජනා ක්‍රම මගින් ජලය සපයනු ලබන “වරාය නගර” ප්‍රභේද පාරිභෝගිකයන්ගේ (ප්‍රභේද අංක 78) ජල ගාස්තු පමණක් වාණිජ බාණ්ඩය හා ඒකාබද්ධ කර පහත සඳහන් ගාස්තු ප්‍රමාණය 2025 සැප්තැම්බර් මස 09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අය කරනු ලබන බව 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතියේ 84 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2024 අගෝස්තු 21 දින අංක 2398/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ “වරාය නගර” ප්‍රභේද පාරිභෝගිකයන් (ප්‍රභේද අංක 78) වෙනුවෙන් පමණක් මෙම සංශෝධනය අදාළ වේ.

**වෛද්‍ය එච්. එම්. සුසිල් රණසිංහ,**<br>
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින,<br>
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය,<br>
12 වන මහල, සෙත්සිරිපාය අදියර II,<br>
බත්තරමුල්ල.

ඕනෑම පරිශ්‍රයක මාසික ජල ගාස්තුවට, පරිහරණ ගාස්තුව, මාසික සේවා ගාස්තුව, අනිකුත් ගාස්තු සහ අදාළ බදු ඇතුළත් වේ. ජල බිල්පතෙහි සාමාන්‍යයෙන් සම්පූර්ණ මාසික ජල ගාස්තුව දැක්වෙන අතර ඕනෑම පාරිභෝගිකයකුට තම ජල බිල්පතට අමතරව එකතුකළ අගය මත බදු ඉන්වොයිසියක් අවශ්‍ය වේ නම්. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පූර්ව ලියාපදිංචි වී එය ලබා ගත හැක.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ගාස්තු අයක්‍රම වගුව 08** (ප්‍රභේද අංක 65, 70, 71, 74, 77, 78, 79, 80, 82, 98)
වාණිජ පරමාර්ථයෙන් ක්‍රියාත්මක වන ආයතන, රජයට අයත් ව්‍යාවසාය ආයතන, සංචාරක හෝටල් සහ නිකේතන, ආයෝජන ප්‍රවර්ධන කලාප කර්මාන්ත, මිශ්‍ර සංවර්ධන, වරාය නගර, වෙනත් වාණිජ හා පෞද්ගලික ආයතන, තානාපති කාර්යාල - එකතු කළ අගය මත බදු අය නොවන වාණිජ ආයතන, මණ්ඩල පරිශ්‍ර වෙත ජලය සැපයීම සහ බවුසර සඳහා ජලය නිකුත් කිරීම

| ඒකක ගණන | පරිහරණ ගාස්තුව | මාසික සේවා ගාස්තුව |
|---|---|---|
| | රු. / ඒකකය | රු. |
| 00 - 25 | 150.00 | 500.00 |
| 26 - 50 | 150.00 | 750.00 |
| 51 - 75 | 150.00 | 1,500.00 |
| 76 - 100 | 150.00 | 1,750.00 |
| 101 - 200 | 150.00 | 2,000.00 |
| 201 - 500 | 150.00 | 3,000.00 |
| 501 - 1,000 | 150.00 | 5,000.00 |
| 1,001 - 2,000 | 150.00 | 10,000.00 |
| 2,001 - 4,000 | 150.00 | 15,000.00 |
| 4,001 - 10,000 | 150.00 | 30,000.00 |
| 10,001 - 20,000 | 150.00 | 60,000.00 |
| 20,000 ට වැඩි | 150.00 | 130,000.00 |

**ගාස්තු අයක්‍රම වගුව 09** (ප්‍රභේද අංක 72)
නාවික සේවා

| ඒකක ගණන | පරිහරණ ගාස්තුව | මාසික සේවා ගාස්තුව |
|---|---|---|
| | රු. / ඒකකය | රු. |
| 00 - 25 | 750.00 | 500.00 |
| 26 - 50 | 750.00 | 750.00 |
| 51 - 75 | 750.00 | 1,500.00 |
| 76 - 100 | 750.00 | 1,750.00 |
| 101 - 200 | 750.00 | 2,000.00 |
| 201 - 500 | 750.00 | 3,000.00 |
| 501 - 1,000 | 750.00 | 5,000.00 |
| 1,001 - 2,000 | 750.00 | 10,000.00 |
| 2,001 - 4,000 | 750.00 | 15,000.00 |
| 4,001 - 10,000 | 750.00 | 30,000.00 |
| 10,001 - 20,000 | 750.00 | 60,000.00 |
| 20,000 ට වැඩි | 750.00 | 130,000.00 |

අංක 2398/19 දරන 2024 අගෝස්තු 21 දිනැති *ගැසට් පත්‍රිකාවේ* සෙසු කොන්දේසි නොවෙනස්ව පවතී.

EOG 11 – 0054

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.